දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපෑල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය
எனது இல.
My No. PSC/APP/16/4/27/2022

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 අගෝස්තු මස 28 දින

---

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ ආයතන ප්‍රධානීන් වෙත,

<u>වැඩ බැලීමේ පත්වීමක වලංගු කාල සීමාව.</u>

තනතුරුවලට පත්කිරීමට සුදුසුකම්ලත් නිලධාරීන් සිටියදී, නිලධාරීන් අසාමාන්‍ය ලෙස දීර්ඝ කාල සීමා සඳහා තනතුරුවල වැඩ බැලීමට පත්කරනු ලබන අවස්ථාවල අඛණ්ඩ වැඩිවීමක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

02. වැඩබැලීමේ පත්වීම්වල වලංගු කාලය නැවත නැවත දීර්ඝ කිරීමෙන් පෙනී යන්නේ නිලධරයකුගේ නිත්‍ය තනතුරත් ඔහු/ඇය වැඩබලනු ලබන තනතුරත් අතර බෙදී යාමට තරම් ප්‍රමාණවත් වැඩ ප්‍රමාණයක් නොමැති බව හා ඒ අනුව අදාළ තනතුරු දෙකම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ තවදුරටත් පවත්වා ගෙන යාම වහා සමාලෝචනය කිරීමේ අවශ්‍යතාව පවතින බවය.

03. ඒ අනුව, අදාළ තනතුරුවලට පත්කිරීමට සුදුසුකම්ලත් නිලධාරීන් සිටින අවස්ථාවලදී, ඊට නෛතික බාධාවක් (අධිකරණයක අතුරු තහනමක් වැනි) නොමැත්තේ නම්, අදාළ පත්කිරීම්හි/ පරිපාලන බලධාරීන් විසින් නිලධාරීන් පුරප්පාඩු තනතුරුවල වැඩබැලීමට පත්කිරීමේදී/ පත්කිරීම් සඳහා නිර්දේශ කිරීමේදී පත්කිරීම්වල වලංගු කාලය අනිවාර්යයෙන්ම 1997.02.03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/97 විධිවිධානවලට අනුකූල බව තහවුරු කර ගත යුතු බව අවධාරණය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.